ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 ජූලි 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2020 ජූනි

සංචරණ සඳහා පනවා තිබූ සීමාවන් සම්පූර්ණයෙන්ම ලිහිල් කිරීමත් සමග, රටේ ආර්ථික ක්‍රියාකාරකම් යථාවත් වීම හේතුකොටගෙන නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ජූනි මාසයේ දී සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. ඒ අනුව 2020 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 18.0කින් ඉහළ යමින් 2020 ජූනි මාසයේ දී 67.3ක අගයක් වාර්තා කරන ලදී.

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2020 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 18.0ක ඉහළ යාමකි. |
|---|---|
| **67.3** | |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යාම කෙරෙහි නිෂ්පාදනය, නව ඇණවුම් සහ සේවා නියුක්තිය පෙර මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතු විය. මේ සඳහා විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන උප අංශ දායක වූ අතර පසුගිය මාසයට සාපේක්ෂව, ප්‍රධාන වශයෙන්ම දේශීය වශයෙන් වූ ඉල්ලුම හේතුවෙන් ජූනි මාසය පුරා සිය කර්මාන්තශාලා ක්‍රියාත්මක වූ බව එම අංශ වල බොහෝමයක් ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කරන ලදී. නව ඇණවුම් වල සිදුවූ ඉහළ යාමට සමගාමීව මෙම මාසය තුළදී නිෂ්පාදනය හා තොග මිලදී ගැනුම් ද ඉහළ යන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන ක්‍රියාකාරකම් වල සිදුවූ වර්ධනයත් සමගම සේවා නියුක්තිය උප දර්ශකය කඩඉම් මට්ටම වන 50 සීමාව ඉක්මවන ලදී. COVID-19 වසංගතය ගෝලීය සැපයුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑනු ලැබූ හෙයින් මෙම කාල සීමාව තුල දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මන්දගාමීව වුවද ඉහළ යන ලදී.

| විචල්‍යය | මැයි | ජූනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **49.3** | **67.3** | **+** | **පහළ යාමක සිට ඉහළ යාමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 47.3 | 73.7 | + | පහළ යාමක සිට ඉහළ යාමක් |
| නිෂ්පාදන | 51.1 | 77.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 37.8 | 51.6 | + | පහළ යාමක සිට ඉහළ යාමක් |
| තොග මිලදී ගැනුම් | 47.9 | 61.1 | + | පහළ යාමක සිට ඉහළ යාමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 66.5 | 63.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන සමස්ථ අපේක්ෂාවන් පෙර මාසයට සාපේක්ෂව සැලකියයුතු ලෙස වැඩිවීමක් පෙන්නුම් කළ ද COVID-19 වසංගතය හේතුවෙන් විදේශීය ඉල්ලුම පහළ යාම ව්‍යාපාර කටයුතු කෙරෙහි තවදුරටත් බලපානු ඇති බව නිෂ්පාදකයින්ගේ මතය වේ.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 5.4 කින් ඉහළ යමින් 2020 ජූනි මාසයේදී 47.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

COVID 19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් 2020 ජූනි මාසයේදී යුරෝපා කලාපය, එක්සත් ජනපදය, රුසියාව සහ ඉන්දියාවේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය නව දුරටත් පහළ මට්ටමක පැවති අතර චීනය සහ එක්සත් රාජධානියෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 ජූලි 15 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ජුනි මාසයේ දී 50.4ක් දක්වා ඉහළ යමින් වර්ධන කලාපයට නැවත පැමිණි අතර, එය සිදු වූයේ නොකඩවා මාස තුනක් කඩඉම් මට්ටටම වන 50.0 සීමාවට පහළ අගයන් වාර්තා කිරීමෙන් අනතුරුවය. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකවල සිදු වූ ඉහළ යෑම මෙම වර්ධනය සඳහා දායක විය.

ආර්ථික කටයුතු ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීමත් සමග ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, රක්ෂණ සහ තොග හා සිල්ලර වෙළඳාම් උපඅංශයන්හි නව ව්‍යාපාර 2020 ජුනි මාසයේ දී ඉහළ ගියේය.

සේවා කටයුතුවල ඉහළ යෑමක් පෙන්නුම් කරමින් ව්‍යාපාර ක්‍රියාකාරකම් ද 2020 ජුනි මාසය තුළ දී ඉහළ ගියේය. අභ්‍යන්තර ගමනාගමන සීමාවන් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම හේතුවෙන් පසුගිය මාසයට සාපේක්ෂව 2020 ජුනි මාසයේ දී ප්‍රවාහන උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය විය. තවද, තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශවල ද වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, ප්‍රවාහන සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උපඅංශවල ප්‍රතිචාර දක්වන්නන් විසින් ජාත්‍යන්තර වෙළඳාමෙහි පසුබෑම සහ ජාත්‍යන්තර සංචරණ සීමාවන් හේතුවෙන් ඔවුන්ගේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට ඇතිවිය හැකි ගැටලුකාරී තත්ත්වය පිළිබඳව සඳහන් කරන ලදී.

කෙසේ වුවද, නව බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන්, පසුගිය මාසයට සාපේක්ෂව 2020 ජුනි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය.

තවද, ඉල්ලුමෙහි ඇතිවන කවර හෝ ඉහළ යෑමකට පවත්නා තත්ත්වය යටතේ මුහුණ දීමට සේවා සපයන්නන්හට හැකි බව පෙන්නුම් කරමින්, නිමකිරීමට නියමිත කාර්යයන් 2020 ජුනි මාසයේ දී පහළ ගියේය.

| විචල්‍යය | මැයි | ජුනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **43.1** | **50.4** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 45.7 | 53.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 34.2 | 54.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 27.7 | 34.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 61.0 | 48.4 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 46.7 | 60.7 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, එළඹෙන මාසවල දී ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරමින්, අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා ඉහළ ගියේය..

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**50.4**

**2020 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.3ක ඉහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 මැයි මාසයේ දී වාර්තා වූ 35.1හි සිට 2020 ජුනි මාසයේ දී 48.0 දක්වා ඉහළ ගිය අතර, එය අඛණ්ඩව මාස පහක් ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි පහළ යෑමක් පෙන්නුම් කරයි.

ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින්, එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 ජුනි මාසයේ දී පහළ ගිය බව පෙන්නුම් කරන ලද අතර, චීනයෙහි වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, ජූලි 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.